කළමනාකරණය පිළිබඳ සමාලෝචනයක්

කල්පිටිය වැලි පර අභය භූමිය

කල්පිටිය අර්ධද්වීපය, බටහිර වෙරළ

එයින් ආරක්ෂා කෙරෙන්නේ මොනවාද?

ශ්‍රී ලංකාවේ වයඹ දිග මුහුදු තීරයට එපිටින් පිහිටා ඇති කල්පිටිය වැලි පර අභය භූමිය, නොගැඹුරු කොරල් පර සහ ගැඹුරු වැලිගල් කොරල් පර ඇතුළු විවිධත්වයෙන් සපිරි සමුද්‍ර පරිසර පද්ධතියක් ආරක්ෂා කරයි. විචිත්‍රවත් වූ කොරල් විශේෂ, ඩොල්ෆින් මත්ස්‍යයන් වැනි සමුද්‍රීය ක්ෂීරපායීන්, දේශීය ජෛව විවිධත්වයට සහය ලබා දෙන අත්‍යවශ්‍ය වූ මුහුදු පැලෑටි ඇතුළු විවිධ වූ සමුද්‍ර ජීවයට මෙම අභය භූමිය නිවහනක් වෙයි.

මෙම සමුද්‍ර අභය භූමිය සංචාරකයන් ආකර්ෂණය කරගන්නා ජනප්‍රිය ගමනාන්තයක් වන අතර සමුද්‍ර ක්ෂීරපායීන් නැරඹීම්, කයිට් සර්ෆින් සහ ස්නෝකර්ලින් හෙවත් නොගැඹුරු මුහුදු යට කිමිදී සුන්දරත්වය නැරඹීම වැනි ක්‍රියාකාරකම් රාශියක් පිරිනමනු ලබයි. එය ප්‍රාදේශීය ප්‍රජාව සඳහා වටිනා ජීවනෝපාය අවස්ථාවන් සපයන්නේ ද වෙයි. ජෛව විවිධත්වයේ පොහොසත් බව සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා අවස්ථාව සැපයීම හේතුවෙන් කල්පිටිය බාධක පරය ශ්‍රී ලංකාවේ ස්වභාවික උරුමයේ සහ වෙරළාශ්‍රිත ආර්ථිකයේ වැදගත් කොටසක් බවට පත්ව ඇත.

වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත (469 අධිකාරිය) යටතේ 1992 අප්‍රේල් මස සමුද්‍ර අභය භූමියක් ලෙස නම් කරා ලදී

විශාලත්වය : එරිග කි.මී 306.7

අප සිදු කළ දේ

සමුද්‍රිත රාජ්‍යයන්ගේ හවුල්කාරිත්ව වැඩසටහන (Ocean Country Partnership Programme - OCPP) සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC), ලද හැකි සාක්ෂ්‍ය සමාලෝචනය කරමින් සහ නීල සම්පත් භාරය (Blue Resources Trust - BRT) විසින් පහසුකම් සලසන ලද වැඩමුළුවක් සහ රැස්වීම් තුළින් දේශීය පාර්ශ්වකරුවන් 33 දෙනෙකු සමග කටයුතු කරමින් 2024 ජනවාරි 26 වෙනි දින කල්පිටිය වැලි පර අභය භූමිය ඇගයීමට ලක් කරන ලදී. වඩාත් හොඳින් සිදුවනේ කුමක් ද යන්නත් කළමනාකරණය වැඩි දියුණු කිරීමට ගත හැකි ප්‍රධාන ක්‍රියාමාර්ග මොනවාද යන්නත් අපි හඳුනාගෙන ඇත්තෙමු

පාර්ශ්වකරුවන්

සමාලෝචනය හා සම්බන්ධ අංශ:

- රජය
- රාජනයතං
- ධීවරයන්
- සංචාරක මෙහෙයුම්කරුවන්
- ප්‍රාදේශීය ප්‍රජාව

හඳුනාගත් තර්ජන

- බොර බව සහ මෝය වෙතින් ගලා එන රොන් මඩ
- කාලගුණ විපර්යාසය
- සංචාරක කර්මාන්තය
- දූෂණය
- පාලන භූමිතාවල පැහැදිලිතාවය මඳ වීම
- නීති විරෝධී මසුන් ඇල්ලීම

වාසභූමිය/විශේෂය	තත්ත්වය	ප්‍රවණතාව
කොරල් පරය	අයහපත්	පරිහානියට පත් වෙමින් ඇත
කොරල් පර මත්ස්‍යයන්	අයහපත්	පරිහානියට පත් වෙමින් ඇත
සාමුද්‍රික ක්ෂීරපායින්	සාමාන්‍ය	වැඩි දියුණු වෙමින් ඇත
මුහුදු පැලෑටි	නොදනී	නොදනී

ආරක්ෂිත ප්‍රදේශයේ කළමනාකරණ ඵලදායිතාව සමාලෝචනය

ආරක්ෂිත ප්‍රදේශයක් නම් කරන විට, එය කෙතරම් හොඳින් කළමනාකරණය වන්නේ ද යන්න අවබෝධ කරගැනීම වැදගත් ය. කළමනාකරණයේ ඵලදායිතාව ඇගයීමට විවිධ ක්‍රම භාවිත කළ හැකි ය. එසේ භාවිත කරන ක්‍රම අතුරින් වඩාත් බහුලව යොදා ගැනෙන්නකි කළමනාකරණ ඵලදායිතා නිරික්ෂණ මෙවලම (METT-4). මෙයට කළමනාකරණ තේමාවන් පහක් වටා පදනම් වූණු ප්‍රශ්න 38කට පිළිතුරු සැපයීම ඇතුළත් වෙයි.

සැලසුම්කරණය

ආරක්ෂිත ප්‍රදේශයට අදාළ නීති සහ සැලසුම්කරණය ඇගැයීම

ආදාන

සම්පත් ඇගයීම: කාර්ය මණ්ඩලය, අයවැය, උපකරණ සහ පහසුකම්

ක්‍රියාවලිය

කළමනාකරණය සිදු කරන ආකාරය ඇගයීම

ප්‍රතිදාන

කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම ඇගයීම; නිෂ්පාදන/සේවා සැපයීම

ප්‍රතිඵල

ප්‍රතිඵල සහ ආරක්ෂිත ප්‍රදේශවල අරමුණු කෙතරම් දුරට සාක්ෂාත් කරගනු ලැබුවේද යන්න ඇගයීම

කළමනාකරණ සංරචක සඳහා METT ලකුණු ප්‍රමාණය



ප්‍රධාන සාර්ථකත්වයන්

1 සමුද්‍ර අභය භූමිය කළමනාකරණය, අධීක්ෂණය සහ එහි අරමුණු ඇගයීම සාක්ෂාත් කරගැනීම පිණිස යෝජිත ක්‍රියාමාර්ග, බාධක පර සමුද්‍ර අභය භූමි කළමනාකරණ සැලසුමක් (2019-2023) මඟින් ලැයිස්තුගත කෙරේ.

2 1980 ගණන්වල සිට දිවෙන කාලය තුළ සමුද්‍ර අභය භූමියේ වාසභූමි, සත්ව විශේෂ, තර්ජන සහ පාලනය පිළිබඳව පර්යේෂණ විශාල ප්‍රමාණයක් සිදු කර ඇත.

3 කොරල් ප්‍රතිස්ථාපනය, සංචාරක ව්‍යාපාරය සඳහා යහපත් භාවිත මාර්ගෝපදේශ සහ සංවේදී වාසභූමි ආරක්ෂාව සඳහා සීමා කරන ලද ප්‍රදේශ හඳුන් කිරීම වැනි සක්‍රිය කළමනාකරණ ක්‍රියාමාර්ග භාවිත වෙමින් පවතී.

4 කොරල් පරය පිරිසිදු කිරීම සහ කොරල් පරය විනාශයට පත් කෙරෙන සිදුවීම් සහ ක්‍රියාකාරකම් වනජීවී දෙපාර්තමේන්තුවට පැමිණිලි කිරීම වැනි දේ මඟින් බිම් මට්ටමේ සිට ප්‍රාදේශීය ධීවර සහ සංචාරක සමිති මෙම කළමනාකරණය සමග සම්බන්ධ වේ.

5 සමුද්‍ර අභය භූමියේ විශාලත්වය සහ හැඩය අවදානමට ලක්ව ඇති පරිසර පද්ධතිය ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් බව පාර්ශ්වකරුවන් විශ්වාස කරයි.

කළමනාකරණය වැඩි දියුණු කිරීම සඳහා වන ප්‍රධාන ක්‍රියාමාර්ග

- SMART (නිශ්චිත, මැනිය හැකි, සාක්ෂාත් කරගත හැකි, අදාළ සහ කාල සීමාවක් වෙන් කෙරුණු) අරමුණු සහ සමුද්‍ර අභය භූමියට ඇති බාධක සම්බන්ධයෙන් මීළඟ වසර පහ තුළ ගත යුතු ප්‍රධාන ක්‍රියාමාර්ග ඇතුළත් කරමින් කළමනාකරණ සැලැස්ම යාවත්කාලීන කිරීම.
- සමුද්‍ර අභය භූමිය කළමනාකරණය කිරීමට සහය ලබා දීම සඳහා දීර්ඝ කාලීන පර්යේෂණ සහ අධීක්ෂණ සැලසුමක් සංවර්ධනය කිරීම.
- අරමුදල් සපයා ගැනීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ තිරසාර මූල්‍ය කළමනාකරණයක් තහවුරු කිරීමට හැකි මූල්‍ය සැලසුමක් සංවර්ධනය කිරීම.
- සංචාරක අත්දැකීම් වැඩි දියුණු කිරීමට සහ සමුද්‍ර අභය භූමිය තුළ වාස භූමි සහ සත්ත්ව විශේෂ ආරක්ෂා කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් ස්ථාපිත කිරීම.
- බලාත්මක කිරීම, අධීක්ෂණය සහ සම්පත් බෙදා හදා ගැනීම වැඩි දියුණු කිරීමට රජයේ නියෝජිතායතන, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රාදේශීය ප්‍රජාව සමග ශක්තිමත් හවුල්කාරිත්වයන් ගොඩ නගා ගැනීම.

මීළඟ පියවර

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (DWC), ඉදිරි කාලයේ ප්‍රමුඛතා නිර්ණය කිරීමට ඇගයීමේ ප්‍රතිඵල භාවිත කරනු ඇත.